# හැඳින්වීම

දේශපාලනික සන්නිවේදනය යනු දේශපාලන විද්‍යාව හා සන්නිවේදනය යන ද්වයේ සංකලනයෙන් බිහි වූ මානව සන්නිවේදනයේ උපක්ෂේත්‍රයකි. සන්නිවේදන විද්‍යාඥයන් වූ ඩෙන්ටන් (Denton) සහ වුඩ්වර්ඩ් (Woodward) සඳහන් කරන ආකාරයට දේශපාලන සන්නිවේදනය යනු

" මහජන සම්පත් ස්ථානගත කිරීම පිළිබඳ නිරවුල් සාකච්ඡාවක්, නිල අධිකාරියක් (ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ අංශයන්ගේ බලය ලබා දීම පිළිබඳ තීරණය) සහ නිල අනුමැතිය " කි.

නමුත් අනෙකුත් සමාජ විද්‍යා සංකල්ප මෙන්ම දේශපාලන සන්නිවේදනය පිළිබඳව ද නිශ්චිත හා නිරවුල් අර්ථකථනයක් ලබා දීම අපහසුය. එය මානව සමාජයේ ප්‍රාරම්භයේ සිටම පැවත එන සජීවී ක්‍රියාකාරීත්වයක් වීම හේතුවෙන් ඒ පිළිබඳ අර්ථ නිරූපණයන් ද, අදාළ යුගයේ හෝ සන්දර්භයේ පරාවර්තනයක් ලෙසින් ඉදිරිපත් වී තිබේ.

අද අප ජීවත් වන්නේ මිනිසාගේ පුද්ගලික ජීවිතය ද සමාජයීය ජීවිතය ද සීඝ්‍රයෙන් ජනමාධ්‍යකරණයට ලක් වෙමින් තිබෙන යුගයකය. දේශපාලනික සන්නිවේදනය යනු මානව සන්නිවේදනයේ විවිධ ස්වරූපයන් අතරින් එක් ස්වරූපයක් පමණි. එහෙත් වර්තමානයේ දී දැකිය හැක්කේ මෙම සියලු ස්වරූපයන් යටපත් කර දමමින් සන්නිවේදන ක්‍රියාවලිය ලෝක සමාජ ජන ව්‍යුහය මත අධිනිශ්චය වීමේ ස්වරූපයකි. මෙම අධිනිශ්චයවීමේ ක්‍රියාවලිය අනුව මනුෂ්‍ය සමාජයෙහි සිදු වන විපර්යාසයන් අතිශය සංකීර්ණ ස්වභාවයක් උසුලයි. අදාළ සංකීර්ණතාව නිසි පරිදි විචාරශීලීව වටහා නොගතහොත්, මිනිසා නැමැති සන්නිවේදන සත්වයා සන්නිවේදන වංකගිරියක අතරමං විය හැකි ය. එම නිසා මෙහිදී දේශපාලනික සන්නිවේදනය යන ක්ෂේත්‍රය තේරුම්ගත යුත්තේ අදාළ යුගයේ සන්නිවේදන ක්‍රියාවලිය මඟින් ගොඩනැගෙන විචාරීය දැනුම පිටිවහල්කොට ගනිමිනි. මෙවන් පසුබිමක බ්‍රයන් මැක්නෙයාර්ගේ (Brain McNair) දැක්ම ඒ සඳහා උත්ප්‍රේරකයන් බවට පත් වෙයි. පරිච්ඡේද කිහිපයක් පමණක් පරිවර්තනය කිරීම මඟින් දේශපාලනික සන්නිවේදනයේ පෘථුල භාවය හා සමස්ත සංකීර්ණතාව නිසි ලෙස අවබෝධ කර ගත නොහැකි වුවත්, බ්‍රයන් මැක්නෙයාර් (Brain McNair) ගේ An Introduction to Political Communication යන ග්‍රන්ථය මුළු මනින්ම කියවූවෙකුට අදාළ ක්ෂේත්‍රයෙහි යථාව මැනවින් ග්‍රහණය කර ගත හැකි වනු ඇත.

## ග්‍රන්ථය පිළිබඳ දළ විශ්ලේෂණයක්,

දේශපාලනික සන්නිවේදනය සඳහා ප්‍රවේශයක් ( An Introduction to Political Communication ) යන ග්‍රන්ථය මඟින් බ්‍රිතාන්‍යයේ, ඇමරිකාවේ හා අනෙකුත් සමකාලීන සමාජයන්හි පවතින මාධ්‍ය, ප්‍රජාතන්ත්‍රවාදය හා දේශපාලනය අතර පවතින්නා වූ සම්බන්ධය පිළිබඳ කරුණු ගවේශනය කරයි. මෙහිදී බ්‍රයන් මැක්නෙයාර් (Brain McNair) විසින් දේශපාලනඥයන්, වෙළඳ සංගමයන්, බලපෑම් කණ්ඩායම්, රාජ්‍ය නොවන සංවිධාන හා ත්‍රස්තවාදී සංවිධාන මාධ්‍ය හරහා ප්‍රයෝජන ලබා ගන්නා ආකාරය අධ්‍යයනය කරයි. ඊට අමතරව දේශපාලනික මාධ්‍ය හා එහි බලපෑම්, දේශපාලන ප්‍රචාරණයේ කාර්යභාරය, අලෙවිකරණය හා මහජන සම්බන්ධතා හරහා රජයේ හා වෙනත් සංවිධානවල සන්නිවේදනය භාවිතයට ගන්නා ආකාරය වෙන් වෙන් වූ පරිච්ඡේද වලින් විස්තර කරයි. මෙම ග්‍රන්ථයේ නව සංස්කරණයන් මඟින් 2001 දී සිදු වූ නැවත පැවැත්වූ කම්කරු පක්ෂ මැතිවරණය, 1997 සිට බ්ලෙයාර් පරිපාලනය මඟින් හඳුන්වා දෙනු ලැබූ රජයේ තොරතුරු හා සන්නිවේදන ප්‍රතිපත්තියේ වෙනස්කම්, 2000 වර්ෂයේ ඇමරිකාවේ ජෝර්ජ්. ඩබ්ලිව් බුෂ් හා මැතිවරණය, කොසෝවෝ ( Kosovo ) හා යුගෝස්ලාවියාවට ( Yugoslavia ) නේටෝ (NATO) ආක්‍රමණ එල්ල වීම, සැප්තැම්බර් 11 ප්‍රහාරය හා අල් ඛයිඩා ( Al-Quaida ) ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය පිළබඳ සවිස්තර කරුණු අන්තර්ගත කර ඇත.